**රාජ්‍ය දැව සංස්ථාව - 2018**
**---------------------------------**

## 1.1 තත්ත්වාගණනය කළ මතය

**---------------------------------**

රාජ්‍ය දැව සංස්ථාවේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, සංස්ථාවේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නාවූ මතය වේ.

## 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

**------------------------------------------------**

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්

**--------------------------------------------------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සංස්ථාව අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය සංස්ථාව ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සංස්ථාවේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සංස්ථාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, සංස්ථාවේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

---

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දූස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස සංස්ථාවේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සංස්ථාවේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු වේ. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විය හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ සංස්ථාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ සංස්ථාවේ විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, සංස්ථාව ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන

### 1.5.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| | අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| අ) | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 01 හි 32 වන වගන්ති ප්‍රකාරව වෙනත් ණයහිමි යටතේ දක්වා ඇති ගණුදෙනුකරු අත්තිකාරම්, මුදලට විකුණුම් අත්තිකාරම් හා මුදල් විකුණුම් පාලන යන ගිණුම් 03 හි එකතුව රු. 161,776,032 ක හර ශේෂයක් හිලව් කර දක්වා තිබුණි. ඒ අනුව මූල්‍ය ප්‍රකාශනවලින් දැක්වෙන ණයහිමි ශේෂයෙහි සත්‍ය තත්ත්වය පිළිඹිබු නොවන බව නිරික්ෂණය විය. | රු. 161,776,032 ක මුදලින් 2019 ජනවාරි මස පියවා ගත් මුදල රු. 106,783,829 කි. එම මුදල 2018 දෙසැම්බර් 31 දිනට ලෙජරයට පිටපත් කිරීමේ ප්‍රමාද දෝෂයක් ඇති වූ හෙයින් එදිනට කිරීමට නොහැකි විය .ඉතිරි මුදල රු. 54,992,203 ක් මෙම කාලය තුල පියවීමට කටයුතු කරන බව කාරුණිකව දන්වමි. | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අනුව කටයුතු කල යුතුය. |
| ආ) | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 16 හි 61 වන වගන්තිය අනුව වත්කමක් සඳහා භාවිතා කරන ක්ෂය ක්‍රමය අඩු තරමින් සෑම මුදල් වර්ෂයක් අවසානයේදී වත්කම් සමාලෝචනය කල යුතු අතර වත්කමේ අනාගත ආර්ථික ප්‍රතිලාභ පරිභෝජනය කිරිමේ අපේක්ෂිත රටාවේ සැලකිය යුතු වෙනසක් වේ නම් එම වෙනස් වූ රටාව නිරූපනය වන ලෙසට ක්ෂය ක්‍රමය වෙනස් කල යුතුය. එවැනි වෙනසක් ගිණුම්කරණ ඇස්තමේන්තුවක වූ වෙනසක් ලෙස ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 08 ප්‍රකාර ගිණුම් ගත කිරිමට කටයුතු කර නොතිබුණි. | සංස්ථාව විසින් ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලවන පරිදි වත්කම් ක්ෂය ප්‍රතිපත්ති හා ප්‍රතිශතයන් තීරණය කරනු ලබන්නේ විශේෂඥයන්ගේ මතය හා වත්කමේ ඵලදායී ජීවිත කාලය යන කරුණු සැලකිල්ලට ගෙනය. භාණ්ඩාගාර ලේකම් විසින් 2018 දෙසැම්බර් 31 දින නිකුත් කරන ලද වත්කම් කළමනාකරණ චක්‍රලේඛ අංක: 2018/04 අනුව හා කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය විසින් 2018 දෙසැම්බර් 31 දින නිකුත් කරන ලද මූල්‍ය නොවන වත්කම් තක්සේරුකිරීම් මාර්ගෝපදේශය අනුව 2019 වර්ෂයේ සංස්ථාව සතු සියලුම වත්කම් නැවත තක්සේරු කිරීමට අවශ්‍යය පියවර ගෙන ඇත. එම කාර්යය අවසන් වූ පසු ක්ෂය ක්‍රමය වෙනස් කිරීම සඳහා කටයුතු කිරීමට බලාපොරොත්තු වන බව දන්වා සිටිමි. | ශ්‍රී ලංකා ගිණුම්කරන ප්‍රමිත අනුව කටයුතු කල යුතුය. |

ඇ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 16 හි 79 වන වගන්තිය අනුව මූල්‍ය ප්‍රකාශන පරිශීලකයන්ගේ අවශ්‍යතාවය මත පහත තොරතුරු හෙළිදරව් කර නොතිබුණි.

| | | |
|---|---|---|
| (i) තාවකාලිකව අක්‍රිය දේපල, පිරියත හා උපකරණවල ධාරණ අගය. | භාණ්ඩාගාර ලේකම් විසින් 2018 දෙසැම්බර් 31 දින නිකුත් කරන ලද වත්කම් කළමනාකරණ චක්‍රලේඛ අංක : 2018/04 අනුව හා කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය විසින් 2018 දෙසැම්බර් 31 දින නිකුත් කරන ලද මූල්‍ය නොවන වත්කම් තක්සේරුකිරීම් මාර්ගෝපදේශය අනුව 2019 වර්ෂයේ සංස්ථාව සතු සියලුම වත්කම් නැවත තක්සේරු කිරීමට අවශ්‍ය පියවර ගෙන ඇත. එම කාර්ය අවසන් වූ පසු තාවකාලික අක්‍රිය වී ඇති වත්කම් අපහරණය කිරීමට හෝ අළුත්වැඩියා කර භාවිත කළ හැකි නම් ප්‍රත්‍යාගණනය කිරීම සඳහා ඉදිරියේදී අවශ්‍ය පියවර ගන්නා බව දන්වා සිටිමි. | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අනුව කටයුතු කල යුතුය. |
| (ii) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 05 ප්‍රකාර ක්‍රියාකාරි භාවිතයේ විශ්‍රාම ගන්වා ඇති සහ විකිණීම සඳහා තබා ඇති සේ වර්ගීකරණය නොකල දේපල පිරියත හා උපකරණ වල ධාරණ අගය. | වර්ෂය තුල අපහරණය කළ යුතු වත්කම් හඳුනාගෙන එම වර්ෂය තුල අපහරණය කරනු ලැබේ. එම අපහරණය කරන ලද වත්කම් සම්බන්ධයෙන් දේපල පිරියත හා උපකරණ පිළිබඳ සටහන් අංක. 08 යටතේ අනාවරණය කර ඇත. | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අනුව කටයුතු කළ යුතුය. |
| (iii) පිරිවැය ආකෘතිය භාවිතා කරන විට දේපල, පිරියත හා උපකරණවල සාධාරණ වටිනාකම ධාරණ අගයෙන් ප්‍රමාණාත්මක ලෙස වෙනස් වන විට සාධාරණ වටිනාකම. | සංස්ථාව සතු සම්පූර්ණ ක්ෂය වූ දේපල පිරියත හා උපකරණ වල ධාරණ අගය සටහන් අංක 08 මගින් හෙළිදරව් කර ඇත. භාණ්ඩාගාර ලේකම් විසින් 2018 දෙසැම්බර් 31 දින නිකුත් කරන ලද වත්කම් කළමනාකරණ චක්‍රලේඛ අංක: 2018/04 අනුව හා කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය විසින් 2018 දෙසැම්බර් 31 දින නිකුත් කරන ලද මූල්‍ය නොවන වත්කම් තක්සේරු කිරීම් මාර්ගෝපදේශය අනුව 2019 වර්ෂයේ සංස්ථාව සතු සියලුම වත්කම් නැවත තක්සේරු කිරීමට අවශ්‍ය පියවර ගෙන ඇත. ඒ අනුව ඉදිරියේදී මෙම වත්කම් ප්‍රත්‍යාගණනය කර සාධාරණ වටිනාකම ධාරණ අගයෙන් ප්‍රමාණාත්මක ලෙස වෙනස්වන විට සාධාරණ වටිනාකම මූල්‍ය ප්‍රකාශන වල හෙළිදරව් කිරීමට කටයුතු කරන බව දන්වා සිටිමි. | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අනුව කටයුතු කළ යුතුය. |

### 1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| කල්දෙමුල්ල අට්ටිමඩුවේ සවිකරන ලද ප්‍රමිතියෙන් බැහැරවූ යකඩ රාක්ක නැවත සකස්කිරිම තුල හදුනාගන්නා ලද අලාභ වටිනාකම රු. 834,124 ක් කල්දෙමුල්ල ගෘහ භාණ්ඩ සංකිර්ණයේ අර්ධ නිමි ගොඩනැගිලි ලෙස ගිණුම් ගත කර තිබුණි. | මේ සම්බන්ධයෙන් සොයාබැලීම සඳහා කමිටුවක් පත් කළ අතර, එම කමිටුව මගින් අලාභය රු. 340,932 ක් ලෙස හදුනාගන්නා ලදී. ඒ අනුව එම මුදල 2019 වර්ෂයේ අප්‍රේල් මස සිට අදාල නිලධාරින්ගෙන් අයකර ගැනීමට අවශ්‍ය පියවර ගෙන ඇත. | නිවරුදිව ගිණුම් තැබිමට කටයුතු කල යුතුය. |

### 1.5.3 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| විෂය | මුදල | නොසැපයූ විගණන සාක්ෂි | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- | --- |
| අර්ධ නිමි ගොඩනැගිලි ලෙස දක්වා ඇති කැප්පෙටිපොල සංකීර්ණයේ ද්විත්ව නිල නිවාසය ඉදිකිරිම. | රු.2,035,694 | ලිපිගොනුව විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | 2011 වර්ෂයේ ඉදිකිරීම් ආරම්භ කර ඇති බැවින් අවශ්‍ය තොරතුරු ලබාගැනීමට කැප්පෙටිපොල ප්‍රාදේශිකය වෙත ඉදිරිපත් කර ඇත. මෙම තොරතුරු ලද වහාම ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව දන්වා සිටිමි. | සංස්ථාවේ ඉදිකිරිම් වලට අදාල තොරතුරු ඉංජිනේරු අංශ විසින් යාවත්කාලිනව පවත්වා ගත යුතුය. |

## 1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

### 1.6.1 ලැබිය යුතු මුදල්

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| අ) | වැඩබිම් සඳහා වෙන්කරන ලද අත්තිකාරම්වලින් 2013 සිට 2017 වර්ෂයන් අතර කාලය තුල ලබාදුන් රු. 10,833,500 ක් හා 2013 වර්ෂයට පෙර ලබාදුන් රු. 1,142,000 ක් 2019 අප්‍රේල් වන විටත් පියවා නොතිබුණි. | ඉදිරියේදි අයකර ගැනිමට කටයුතු කරනු ලැබේ. | මුදල් රෙගුලාසි ප්‍රකාරව නොපියවූ අත්තිකාරම් මුදල් සම්බන්ධයෙන් කටයුතු කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| ආ) | 1983 වර්ෂයේ සිට පෞද්ගලික සමාගමකින් අයවිය යුතු රු. 11,871,954 ක්, රාජ්‍ය හා අර්ධ රාජ්‍ය ආයතනවලින් අයවිය යුතු රු. 207,910,689 ක්, පෞද්ගලික ආයතනයෙන් රු. 1,687,042 ක් හා පුද්ගලයන් දෙදෙනකුගෙන් අයවිය යුතු රු. 777,353 ක් වර්ෂ 04 කට වැඩි කාලයක් ඉක්මවා තිබුණද ඒවා අයකර ගැනිමට කටයුතු කර නොතිබුණි. | රාජ්‍ය ආයතන වලින් මුදල් අයකරගැනීමට ප්‍රමාද විම. මෙයට හේතු වන අතර පුද්ගලික ගණුදෙනුකරුවන්ගෙන් අයවිය යුතු මුදල් අලෙවි අංශය මගින් අයකර ගැනීමට කටයුතු කරනු ලැබේ. | ණයගැති ශේෂයන් නිරවුල් කර ගැනිමට නිත්‍යානුකූලව කටයුතු කල යුතු බව. |
| ඇ) | මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශයෙන් සහ වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවෙන් අයවිය යුතු විදුලිය, ජල ගාස්තු හා ගොඩනැගිලි කුලී පිළිවෙලින් රු.1,661,487 ක් හා රු. 31,333,241 ක් 2018 දෙසැම්බර් 31 දින වන විටත් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශයෙන් හා වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවෙන් අයවිය යුතු ඉහත මුදලින් ගොඩනැගිලි කුලී සඳහා වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවෙන් 2014 වර්ෂයේ සිට ගෙවීම් කර නොමැත. ජල, විදුලි ගාස්තු නියමිත පරිදි ගෙවනු ලබන අතර, 2018 අවසන් මාසවල මුදල් 2019 වර්ෂයේ ගෙවීම් කර ඇත. | අයවීමට ඇති ගාස්තු හා කුලී කඩිනමින් අයකර ගැනිමට කටයුතු කල යුතු බව. |

## 1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| අ) | මුදල් රෙගුලාසි 571 (2) | වර්ෂ 2 ක් ඉක්මවූ ගැන් නේයිල් තැන්පතු රු. 1,258,635 ක් වර්ෂ 2 ක සිට වර්ෂ 5 දක්වා අතර කාලයක් ඉක්මවූ පසු ආරම්භක තැන්පතු රු. 133,800 ක් කොන්ත්‍රාත් රඳවා ගත් මුදල් රු. 2,513,001 ක් හා ටෙන්ඩර් තැන්පතු රු. 7,783,104 ක් නිරවුල් කිරිමට හෝ මුදල් රෙගුලාසි 571(2) ප්‍රකාරව ආදායමට ගැනිමට කටයුතු කර නොතිබුණි. | නුවරඑළිය වැපල්ටන් වතුයායේ තැන්පතු වෙනුවෙන් නිතිමය කටයුතු ඇති බැවින් මෙතෙක් නිදහස් කර නොමැති අතර දිගුකාලින පවතින ඉතිරි තැන්පතු සංස්ථාව සතු කිරිමට කටයුතු කරනු ලැබේ. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කල යුතු බව. |
| ආ) | 1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරි පනත | 2017 නොවැම්බර් 15 දින අනුරාධපුර ප්‍රාදේශිය කාර්යාලය ඉදිකිරිම ආරම්භකර තිබුණද ඊට අදාල සැලැසුම් සඳහා නාගරික සංවර්ධන අධිකාරි මඟින් අනුමැතිය 2018 දෙසැම්බර් 03 වන දින විටද ලබාගෙන නොතිබුණි. | අනුරාධපුර ප්‍රාදේශීය කාර්යාල ගොඩනැගිල්ලේ අනුමැතිය සඳහා අදාල ලියකියවිලි අනුරාධපුර ප්‍රාදේශිකය වෙත 2017 අප්‍රේල් 19 දින යවා ඇත. ඉදිරියේ දී එම අනුමැතිය ලබාගැනීමට කටයුතු යොදා ඇත. | පනතේ විධි විධාන ප්‍රකාරව පූර්ණ අනුමැතිය ලබා ගැනිමට කටයුතු කල යුතු බව. |

## 1.8 බදු රෙගුලාසිවලට අනුකූල නොවීම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| ගෙවිය යුතු ජාතිය ගොඩනැගීමේ බදු හා එකතු කළ අගය මත බදු ශේෂය මූල්‍ය ප්‍රකාශන අනුව රු. 59,871,133 වූ අතර අදාල බදු වාර්තා අනුව රු. 63,841,605 වුයෙන් රු. 3,970,472 ක වෙනසක් නිරීක්ෂණය විය. | මෙම වෙනසට හේතුව අප විසින් මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට පෙර 2018 වර්ෂයට අදාල සියලු බදු 2019 ජනවාරි 20 දින වනවිට ගෙවීම් කර තිබීමයි .එසේම මාසික බදු වාර්තාවල විකුණුම් සහ ලෙජරයේ විකුණුම් අතර අවශ්‍ය ගැලපීම් සිදුකරනු බැවින් ලෙජරයේ දැක්වෙන විකුණුම් වටිනාකම සහ මාසික වාර්තාවල සුළු වෙනසක් ඇති වියහැක. කෙසේ වුවත්, අප විසින් VAT හා NBT බදු මුදල් වශයෙන් 2018 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති රු.මිලියන 4, 151 සම්පූර්ණ අලෙවි මුදල සඳහා පූර්ණ වශයෙන් VAT හා NBT බදු ගෙවීම් කර ඇති බව මින් කාරුණිකව දන්වමි.<br><br>ඒ අනුව VAT බදු වාර්තාවෙහි රු. මිලියන 4,152 ක් සඳහා VAT බදු ගෙවා තිබූ අතර, NBT බදු වාර්තාවෙහි රු .මිලියන 4,152 ක් සඳහා NBT බදු මුදල් ගෙවා තිබුණි. | නිශ්චිත වර්ෂයට අදාලව බදු එම වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවලට ඇතුලත් කර නිවැරදිව ගිණුම් ප්‍රකාශ පිළියෙල කල යුතු බව. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 672,432,854 ක ලාභයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ ලාභය රු. 966,804,360 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 294,371,506 ක පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමට මෙහෙයුම් ආදායම සියයට 30 කින් පහළ බැසීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

සංස්ථාවේ අරමුණු අතරින් කෘෂි කාර්මික නිෂ්පාදන, වේවැල් ආනයනය යන අරමුණු ඉටුකර ගැනීමට සංස්ථාව කටයුතු කර නොමැති අතර අපේක්ෂිත පරිදි දැව අතුරු භාණ්ඩ නිෂ්පාදනය හා අලෙවියද සිදු කර නොතිබුණි. සමාලෝචිත වර්ෂයේදී සිල්පර දැව අපනයනයද සිදු කර නොතිබුණි. එමෙන්ම දැව ආශ්‍රිත නිමි හා අර්ධ නිමි භාණ්ඩ අපනයනය කිරීම සංස්ථාවේ අරමුණක් වුවද එම අරමුණු ඉටු කර ගැනීම සඳහා සංස්ථාව කටයුතු කර නොතිබුණි.

### 2.2 ප්‍රධාන ආදායම් හා වියදම් විෂයයන්වල ප්‍රවණතා විශ්ලේෂණය

සංස්ථාවේ බදුවලට පෙර ලාභය ඉකුත් වර්ෂයට සාපේක්ෂව රු. 294.371,506 කින් අඩු වී තිබුණු අතර එය ප්‍රතිශතයක් ලෙස සියයට 30.4 කින් පසුබෑමකි. මේ සඳහා වෙළඳ ආදායම රු. 184,754,000 කින් හෙවත් සියයට 4.3 කින් පහල වැටීමත්, වෙනත් ආදායම් යටතේ මෙහෙයුම් ආදායම රු. 29,964,339 කින් හෙවත් සියයට 29 ක ප්‍රතිශතයකින් පහත වැටීමත් ප්‍රධාන වශයෙන් බලපා තිබුණු බව විගණනයට නිරීක්ෂණය විය.

## 2.3 අනුපාත විශ්ලේෂණය

සමාලෝචිත වර්ෂයේ ද්‍රවශීලතා අනුපාතය සළකා බැලීමේදී ජංගම අනුපාත 1 : 4.33 ක් හා ක්ෂණික අනුපාතය 1 : 2.78 ක ඉහළ අගයක් ගන්නා බැවින් සංස්ථාවේ මූල්‍ය තත්ත්වය ඉතා හොඳ මට්ටමක පවති. එහෙත් තොග පිරිවැටුම් අනුපාතය ඉකුත් වර්ෂයට සාපේක්ෂව 1.81 සිට 1.25 දක්වා අඩුවී ඇති බැවින් අලෙවි ආදායම අඩු වීමේ ප්‍රවණතාවක් පවතින බව විගණනයට නිරීක්ෂණය විය.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| අ) | අනුරාධපුර රාජ්‍ය දැව සංස්ථා ප්‍රාදේශිය කාර්යාල ගොඩනැගිල්ල හා නිල නිවාස ඉදිකිරීමේදී ගිවිසුම් අනුව 2018 මාර්තු 21 දින නිම කල යුතු වුවත් එලෙස නිම කර නොතිබුණි. 2018 අගෝස්තු 25 දින දක්වා කාලය දිර්ඝ කර තිබුණද 2018 දෙසැම්බර් 03 වන විටත් ඉදිකිරීම් නිම කර නොතිබුණි. ඒ අනුව 2018 අගෝස්තු 25 දිනෙන් පසු දිනකට රු. 15,000 බැගින් රු. 1,500,000 ක ප්‍රමාද දඩ මුදල් අයකල යුතු වුවද එම මුදල් අයකර ගැනිමට කටයුතු කර නොතිබුණි. නියමිත කාලයට නිම නොකිරිම හේතුවෙන් කාර්යාල බදු කුලි ලෙස රු. 375,000 ක් වැය කිරිමට සිදු වී තිබුණි. කාර්ය සාධන සුරක්ෂණයේ (Performance Bond) හා රක්ෂණ ආවරණයේ කාලය දිර්ඝ කිරිමට කොන්ත්‍රාත්කරු විසින් කටයුතු කර නොතිබුණි. | මෙම කොන්ත්‍රාත්තුව 2018 අගෝස්තු 25 දිනට වැඩ අවසන් කළ බවට කොන්ත්‍රාත් සමාගම විසින් දන්වා ඇත. එම දිනෙන් පසුව සංස්ථාව මගින් සිදුකරන දොර ජනේල් පොලිෂ් කිරීම හා සවිකිරීම කරගෙන ගිය බව වැඩිදුරටත් සඳහන් කරමි. | ගිවිසුම් ගත කාලය අනුව ඉදිකිරීම් කටයුතු හා කොන්ත්‍රාත්තු අවසන් කිරිමට කටයුතු කිරිම තුලින් මූල්‍යමය පාඩු අවම කර ගැනිමට කටයුතු කල යුතු බව. |
| ආ) | 2017 සැප්තැම්බර් 13 වන දින ඉදිකිරීම් ආරම්භකරන ලද පදියතලාව ගබඩා නිලධාරී කාර්යාලයේ ඉදිකිරීම් කටයුතු 2018 දෙසැම්බර් 31 වන විට අවසන් කර නොතිබුණි. | පදියතලාව ගබඩා නිලධාරි කාර්යාලයේ පිරිවැය රු.1,976,336 ක් ස්ථාවර ගොඩනැගිලි ලෙස ප්‍රාග්ධනිත කළයුතු වුවද, සිදුවූ ප්‍රමාද දෝෂයකින් අර්ධ නිමි ලෙසින් ගිණුම්ගත කර ඇත. මෙය 2019 වර්ෂයේ නිවැරදි කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්නා බව දන්වා සිටිමි. | නියමිත කාලය තුල ඉදිකිරීම් හා කොන්ත්‍රාත් වැඩ අවසන් කිරිමට කටයුතු කල යුතු බව. |